සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2025
இரண்டாம் தவணைப் பரீட்சை - 2025 / Second Term Test - 2025

34290

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | ඉතිහාසය - I | කාලය / நேரம் / Time | පැය 01 යි |
|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

සැලකිය යුතුයි :-
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

1. ලංකා ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබාගත හැකි පැරණිතම සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ,
(1) මහාවංශය යි. (2) දීපවංශය යි. (3) ධාතුවංශය යි. (4) ථූපවංශය යි.

2. මහාවංසටීකාව ලෙස හඳුන්වන කෘතිය කුමක්ද ?
(1) දීපවංශය (2) වංසත්තප්පකාසිනිය
(3) නිකායසංග්‍රහය (4) රාජාවලිය

3. මෙරට ශාසන ඉතිහාසය ට මුල් තැනක් දෙමින් රචිත ග්‍රන්ථයක් වන්නේ
(1) රාජාවලිය යි. (2)බෝධිවංශය යි. (3) පූජාවලිය යි. (4) නිකාය සංග්‍රහය යි.

4. නාණක විද්‍යාව විෂයයෙන් හදාරනු ලබන්නේ මින් කුමක් පිළිබඳව ද ?
(1) ලෝහ කර්මාන්තය (2) වාස්තු විද්‍යාව
(3) කුඹල් කර්මාන්තය (4) පැරණි කාසි

5. අනුරාධපුර යුගයේ මුල් කාලීන ශිලා ලිපිවල භාවිත කර ඇති අක්ෂර හඳුන්වන්නේ කවර නමකින්ද ?
(1) ඛරෝෂ්ඨී (2) බ්‍රාහ්මී (3) මාගධී (4) ප්‍රාකෘත

6. ගල්තලා මත ලියා ඇති ලේඛන හඳුන්වනු ලබන්නේ කිනම් නමකින්ද ?
(1) ගිරි ලිපි (2) ලෙන් ලිපි (3) වැම් ලිපි (4) පුවරු ලිපි

7. ප්‍රාග් ඓතිහාසික යුගයේ තාක්ෂණය පිළිබඳ දැනගැනීමට ඇති එකම සාධකය වන්නේ
(1) යකඩ මෙවලම් ය. (2) මැටි වලං ය.
(3) සුසාන භූමි ය. (4) ගල්මෙවලම් ය.

8. ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාරයට ගත් බෙල්ලන් වර්ග සුලබව දක්නට ලැබෙන පරිසර කලාපය කුමක් ද ?
(1) පහතරට වියළි කලාපය (2) තෙත් කලාපය
(3) ශුෂ්ක කලාපය (4) කඳුකර වියළි කලාපය



EXAMRESULTS.LK

9. ශ්‍රී ලංකාව මිනිස් වාසයක් බවට පත් වූයේ මීට වසර කීයකට පෙර ද ?
   (1) එක් ලක්ෂ විසිපන්දහසකට (2) අසූ දහසකට
   (3) තිස් පන්දහසකට (4) විසි අට දහසකට

10. ශ්‍රී ලංකාවේ යකඩ භාවිතය පිළිබඳව මුල්වරට පැහැදිලි පුරාවිද්‍යාත්මක සාධක හමුවන්නේ
   (1) ප්‍රාග් ඓතිහාසික යුගයේදී ය. (2) පූර්ව ඓතිහාසික යුගයේදී ය.
   (3) මුල් ඓතිහාසික යුගයේදී ය. (4) ඓතිහාසික යුගයේදී ය.

11. මුල් ඓතිහාසික යුගයේ ජනතාව ගංගා නිම්නවලින් පිටත ප්‍රදේශ පදිංචිය සඳහා තෝරාගැනීමට හේතුව කුමක් ද ?
   (1) ගංවතුර උවදුරෙන් ආරක්ෂා වීම. (2) වන සතුන්ගෙන් බේරීම.
   (3)කෘෂිකර්මාන්තයට හිතකර සාධක තිබීම. (4) ප්‍රවාහන පහසුව ලබා ගැනීම.

12. පුරාණ ශ්‍රී ලංකාවේ වරාය ආශ්‍රිතව ගොඩනැගුණු ජනාවාස හැඳින්වූයේ කුමන නමින්ද ?
   (1) කේවට්ටගාම (2) කසීකාරගාම (3) වඩ්ඩකීගාම (4) පට්ටානගාම

13. මුල් ඓතිහාසික යුගයේ ලංකාවේ ජනාවාස ව්‍යාප්තව පැවතියේ කිනම් ප්‍රදේශවල දැයි පෙන්නුම් කරන ප්‍රධාන සාධකය කුමක් ද?
   (1) ගම්වැව් වල ව්‍යාප්තිය (2) ගල් ලෙන්වල ව්‍යාප්තිය
   (3) රතුදුඹුරු පස්වල ව්‍යාප්තිය (4) තැනිතලා බිම්වල ව්‍යාප්තිය

14. පවුලක් නියෝජනය කරන ලද තැනැත්තා බ්‍රාහ්මී සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ කුමන නමින් ද
   (1) ගමික (2) ගහපති (3) පරුමක (4) ග්‍රාමභෝජක

15. ප්‍රථම වරට දිවයිනේ ග්‍රාමසීමා නියම කරවන ලද රජතුමා කවුරුන්ද ?
   (1) පණ්ඩුකාභය (2) දේවානම්පියතිස්ස (3) වසභ (4) වළගම්බා

16. රාජ්‍යත්ව සංකල්පයේ වර්ධනය සමග නරේෂ්වර ලෙස පෙනී සිටීමට උත්සාහ කළ පාලකයා කවුරුන් ද ?
   (1) දුටුගැමුණු රජතුමා (2) භාතිකාභය රජතුමා
   (3) කුටකණ්ණ අභය රජතුමා (4) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා

17. ඉලනාග රජු විසින් තිස්සමහාරාම වැව ඉදිකිරීම සඳහා අමුණක් බඳින ලද්දේ කුමන ගංගාව හරස් කිරීමෙන්ද ?
   (1) වලවේ ගඟ (2) කුඹුක්කන් ඔය (3) කිරිඳි ඔය (4) මැණික් ගඟ

18. අනුරාධපුර යුගයේදී රාජ්‍ය උරුමය පියාගෙන් පසු පුතාට හිමි වූ අවස්ථාවක් වන්නේ,
   (1) දේවානම්පියතිස්ස රජු ගෙන් පසු උත්තිය රජ වීම යි.
   (2) මුටසීව රජුගෙන් පසු කාවන්තිස්ස රජ වීම යි.
   (3) වසභ රජුගෙන් පසු වංකනාසිකතිස්ස රජවීම යි.
   (4) දුටුගැමුණු රජුගෙන් පසු සද්ධාතිස්ස රජ වීම යි.

19. අතීතයේදී ලංකාවේ පරුමකවරුන් සතුව පැවති දේශපාලන බලය මධ්‍යගත පාලන ක්‍රමයක් බවට පත් කළ ප්‍රථම පාලකයා වූයේ,
   (1) පණ්ඩුකාභය රජතුමා ය. (2) දුටුගැමුණු රජතුමා ය.
   (3) කාවන්තිස්ස රජතුමා ය. (4) වසභ රජතුමා ය.

20. අතීතයේදී අනුරාධපුර පළාතේ ගැමියන් විසින් කාලයක් අතහැර දමා යළිත් වගා කිරීම අරඹන හේන් හඳුන්වා ඇත්තේ කුමන නමින්ද ?
   (1) නව දැලිහේන (2) සෙහෙන් (3) කනත්ත (4) පිටබිම්

21. පැරණි සාහිත්‍ය මූලාශ්‍රවල **"වෙජ්ජ ශාලා"** යනුවෙන් හඳුන්වා ඇත්තේ මොනවාද ?
(1) රෝහල් (2) පන්සල් (3) දානශාලා (4) සොත්තිසාලා

22. පුරාණ වෙළඳපළවල් සංවිධානාත්මක ලෙස පාලනය වූ බව සඳහන් වන සෙල්ලිපිය කුමක්ද ?
(1) කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය (2) හෝපිටිගම ටැම් ලිපිය
(3) වෙවැල්කැටිය සෙල්ලිපිය (4) තෝනිගල සෙල්ලිපිය

23. හේමමාලා සහ දන්ත කුමරුන් මෙරටට දන්ත ධාතුව රැගෙන පැමිණියේ කිනම් වරායෙන්ද ?
(1) දඹකොල පටුන (2) ලංකා පටුන (3) මහාතිත්ථ (4) ගෝකණ්ණ තිත්ථ

24. අරාබි ජාතීන් ශ්‍රී ලංකාව හැඳින්වීමට භාවිතා කර ඇත්තේ,
(1) තැප්‍රොබේන් ය. (2) සෙයිලන් ය. (3) සිලෝන් ය. (4) සරන්ඩිබ් ය.

25. ත්‍රිපිටක ධර්මයට වැඩි විස්තර සහිත අටුවා රචනා කළ විදේශික භික්ෂූන් වහන්සේ නම
(1) බුද්ධඝෝෂ හිමියන් ය. (2) හියුං සෑං හිමියන් ය.
(3) පාහියන් හිමියන් ය. (4) ඉත්සිං හිමියන් ය.

26. සමනල කන්ද **"ආදම්ගේ කන්ද"** යන විශ්වාසය පදනම් කරගෙන වන්දනාමාන කරන ලද්දේ
(1) ක්‍රිස්තු බැතිමතුන් ය. (2) බෞද්ධ බැතිමතුන් ය.
(3) ඉස්ලාම් බැතිමතුන් ය. (4) හින්දු බැතිමතුන් ය.

27. පොළොන්නරු රාජධානියට සමීපව පිහිටා තිබූ අන්තර්ජාතික වරාය වන්නේ
(1) මහාතිත්ථ ය. (2) ලංකා පට්ටන ය. (3) ගොඩවාය ය. (4) ගෝකණ්ණ තිත්ථ ය.

28. පහත සඳහන් "අ" "ආ" තීරු නිවැරදිව ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| I මහසෙන් රජතුමා | A කන්තලේ වැව |
| II ධාතුසේන රජතුමා | B තිසා වැව |
| III දෙවන අග්බෝ රජතුමා | C කලා වැව |
| IV දේවානම්පියතිස්ස රජතුමා | D මින්නේරිය වැව |

(1 )A B C D (2) B C A D (3) D C B A (4) D C A B

29. වැවක ඉතා වැදගත් අංගයක් වන වැවෙන් ජලය පිටතට ගලා එන ගලින් තැනූ ආයත චතුරස්‍රාකාර අවකාශය හඳුන්වන නම කුමක්ද ?
(1) පිටවාන (2) බිසෝකොටුව (3) සොරොව්ව (4) රළපනාව

30. වියළි කලාපයේ පිහිටි වැව් රාශියකට ජලය ගෙනයන අඹන් ගඟ හරස් කර ඉදිකර තිබෙන ඇළහැර ඇළ ඉදි කරවූ රජතුමා කවුරුන්ද ?
(1) ධාතුසේන රජතුමා (2) මහසෙන් රජතුමා
(3) වසභ රජතුමා (4) දෙවන මුගලන් රජතුමා

31. අතීතයේදී කිරිමඩු ශාන්ති කර්මය පවත්වා ඇත්තේ මින් කවර සතෙකුගේ ආරක්ෂාව සඳහාද ?
(1) ගවයා (2) ඌරා (3) කුකුළා (4) එළුවා

32. අපේ පැරන්නන් අවකාශය මැනීම සඳහා භාවිත කරන ලද මිනුම කුමක්ද ?
(1) ස්වර්ණ (2) කරිස (3) යොදුන (4) ගුංජා

33. ප්‍රධාන මාවත්වල ගව්වෙන් ගව්වට ගල්කණු සිටුවීමට නියෝග කළ රජතුමා නම්,

(1) පළමු වන විජයබාහු ය. (2) පළමු වන පරාක්‍රමබාහු ය.

(3) දෙවන පරාක්‍රමබාහු ය. (4) කීර්ති ශ්‍රී නිශ්ශංක මල්ල ය.

34. අචල ජල විද්‍යා මූලධර්මය පිළිබඳ අපේ පැරණි ශිල්පීන්ට තිබූ දැනුම පෙන්වන නිර්මාණයක් වන්නේ

(1) යකඩ නිස්සාරණ උදුන (2) ගල් පාලම

(3) ලෝකඩ ඇත් පහන (4) ලෝහ කතුරු

35. පැරණි සෙල්ලිපිවල කුඩීන් ලෙස හඳුන්වා ඇත්තේ,

(1) ධනවත් වෙළඳ ප්‍රධානීන් ය. (2) දාසයින් ය.

(3) වෛද්‍යවරුන් ය. (4) සාමාන්‍ය ජනතාව ය.

36. රජුට අයත් ඉඩම් වල වගා කිරීම වෙනුවෙන් ගෙවන ලද බද්ද හඳුන්වා ඇත්තේ

(1) දකපති නමිනි. (2) කැති අඩ නමිනි.

(3) බොජකපති නමිනි. (4) මතරමජිබක නමිනි.

37. අපරාධ නීතිය සම්බන්ධයෙන් පාලකයන් දැඩිව ක්‍රියා කළ බව සඳහන් වන සෙල්ලිපිය කුමක්ද ?

(1) වේවැල් කැටිය සෙල්ලිපිය (2) මිහින්තලා පුවරු ලිපිය

(3) වෙස්සගිරිය සෙල්ලිපිය (4) කොණ්ඩවට්ටවාන් වැව් ලිපිය

38. සිය දියණිය විවාහ වී නිවෙසින් නික්මෙන අවස්ථාවේ **"මාගේ දුවණියට කිරි කන්නට සරක් හානකුත් දුන මනාවේදැයි"** යනුවෙන් පියෙකු අසන ආකාරය දැක්වෙන මූලාශ්‍රය වන්නේ

(1) සද්ධර්මාලංකාරය ය. (2) පූජාවලිය ය.

(3) සද්ධර්මරත්නාවලිය ය. (4) දම්පියා අටුවා ගැටපදය ය.

39. අපේ අතීත ජනතාවගේ ආහාර රටාව අනුව නිවැරදි ප්‍රකාශය මින් කුමක්ද ?

(1) ධාන්‍ය වර්ග පමණක් ආහාරයට ගැනීම.

(2) කැඳවර්ග වලට වැඩි අවධානයක් යොමු කිරීම.

(3) කෘතිම ආහාර ද පරිභෝජනය කිරීම.

(4) පෝෂණ ගුණයට හානි නොවන ලෙස සකසා ආහාරයට ගැනීම.

40. **"රන් දෙව්සි කළද නම්"** ලෝහ කැබැල්ල හමුවී ඇති ස්ථානය වන්නේ,

(1) ජේතවන විහාර භූමිය යි. (2) මහා විහාර භූමිය යි.

(3) අභයගිරි විහාර භූමිය යි. (4) මිරිස වැටි විහාර භූමිය යි.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

දෙවන වාර පරීක්ෂණය - 2025
**இரண்டாம் தவணைப் பரீட்சை - 2025 / Second Term Test - 2025**

34296

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | ඉතිහාසය - II | කාලය / நேரம் / Time: පැය 03 යි විනාඩි 10 |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................................

සැලකිය යුතුයි :-

- එක කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- දෙක කොටසින් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

---

## I කොටස

1) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

i. දඹකොල පටුන, දේවනගර්, යෝධ වැව, ඇදුරුඹය, කෝට්ටෙ ,වලවේ ගඟ, පරාක්‍රම සමුද්‍රය අනුරාධපුරය, පාහියන්ගල, සීගිරිය, ගෝකන්නතිත්ථ, මඩකලපුව

ලකුණු (12)

ii. පෘතුගාලය, රතු මුහුද, කැලිකට්, බතාවිය, චීනය, මලය අර්ධද්වීපය

ලකුණු (06)


(ආ) (i) පහත A,B,C,D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. ශ්‍රී ලංකාවේ දිගම සෙල්ලිපිය වන ගල් පොත සෙල්ලිපිය කර වූ රජතුමා නම් කරන්න.
B. විශාල වැව් ඉදිකිරීමේ පුරෝගාමී වූ රජතුමා කවුරුන්ද ?
C. මැටි බඳුන් නිපදවීමට භාවිතා කරන උපකරණය කුමක්ද ?
D. වැවේ තරංග මගින් වැව් බැම්ම ඛාදනය වීම වළක්වාලීමට ඉදිකර තිබෙන ව්‍යුහය හඳුන්වන නම කුමක්ද ?

ලකුණු (04)

(ii) A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

1. A රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද ?
2. එය සොයාගෙන ඇති ස්ථානය නම් කරන්න.
3. එය අයත් වන යුගය කුමක්ද ?
4. ඒවා භාවිත කර ඇත්තේ කවුරුන්ද ?



A රූපය

ලකුණු (04)

iii. 1. B රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද ?

2. එය දක්නට ඇති ස්ථානය ලියන්න.

3. එය කරවූ රජතුමා නම් කරන්න.

4. ඉන් පෙන්නුම් කෙරෙන්නේ කවුරුන්ද ?



B රූපය

(ලකුණු 04)

## <u>II කොටස</u>

2. i. ඉතිහාසය ගොඩනැගීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය භාවිත කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

ii. පහත A, B, C හා D යටතේ දක්වා ඇති තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

A. කෝට්ටේ යුගයේදී රචිත ප්‍රශස්ති කාව්‍යය.

B. රොබට් නොක්ස් විසින් රචිත ග්‍රන්ථය.

C. පොළොන්නරු රාජ්‍ය සමයේ භාවිත කළ කාසි වර්ගය.

D. අශ්ව හිස හා මිනිසා මූර්තිය දක්නට ලැබෙන ස්ථානය. (ලකුණු 04)

iii. a. පුරා විද්‍යාත්මක මූලාශ්‍රය විනාශවීමට බලපාන මානව ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න

b. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ආරක්ෂා කර ගැනීමට ඔබ කරන යෝජනා තුනක් ලියන්න

(ලකුණු 05)

iv. ඉතිහාසය ඉගෙනීමෙන් ලද හැකි ප්‍රයෝජන තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

3. i. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මානවයා ජීවත් වූ පරිසර කලාප තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. ප්‍රාග් ඓතිහාසික මානවයා සිය වාසස්ථානය තෝරාගැනීමේ දී අවධානය යොමු කරන ලද කරුණු දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. a. ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාරයට ගත් ශාකමය ආහාර දෙකක් හා

b. සත්ත්වමය ආහාර තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

iv. පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන්වන කරුණු තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

4. i. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. මහාවංශයේ සඳහන් වාපිගාම හතරක් ලියන්න. (ලකුණු 04)

iii. a. පූර්ව ඓතිහාසික යුගය යනුවෙන් සැලකෙනුයේ කවර කාල පරිච්ඡේදයක්ද ?

b. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් මැටි ඔරු සුසාන භූමි පිහිටි ස්ථාන තුන ලියන්න. (ලකුණු 05)

iv. මුල් ඓතිහාසික යුගයේ දී ජනාවාස ව්‍යාප්ති රටාවේ දක්නට ලැබෙන ලක්ෂණ තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

iii. 1. B රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද ?

2. එය දක්නට ඇති ස්ථානය ලියන්න.

3. එය කරවූ රජතුමා නම් කරන්න.

4. ඉන් පෙන්නුම් කෙරෙන්නේ කවුරුන්ද ?



B රූපය

(ලකුණු 04)

## II කොටස

2. i. ඉතිහාසය ගොඩනැගීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය භාවිත කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

ii. පහත A, B, C හා D යටතේ දක්වා ඇති තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

A. කෝට්ටේ යුගයේදී රචිත ප්‍රශස්ති කාව්‍යය.

B. රොබට් නොක්ස් විසින් රචිත ග්‍රන්ථය.

C. පොළොන්නරු රාජ්‍ය සමයේ භාවිත කළ කාසි වර්ගය.

D. අශ්ව හිස හා මිනිසා මූර්තිය දක්නට ලැබෙන ස්ථානය. (ලකුණු 04)

iii. a. පුරා විද්‍යාත්මක මූලාශ්‍රය විනාශවීමට බලපාන මානව ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න

b. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ආරක්ෂා කර ගැනීමට ඔබ කරන යෝජනා තුනක් ලියන්න

(ලකුණු 05)

iv. ඉතිහාසය ඉගෙනීමෙන් ලද හැකි ප්‍රයෝජන තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

3. i. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මානවයා ජීවත් වූ පරිසර කලාප තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. ප්‍රාග් ඓතිහාසික මානවයා සිය වාසස්ථානය තෝරාගැනීමේ දී අවධානය යොමු කරන ලද කරුණු දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. a. ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාරයට ගත් ශාකමය ආහාර දෙකක් හා

b. සත්ත්වමය ආහාර තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

iv. පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන්වන කරුණු තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

4. i. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. මහාවංශයේ සඳහන් වාපිගාම හතරක් ලියන්න. (ලකුණු 04)

iii. a. පූර්ව ඓතිහාසික යුගය යනුවෙන් සැලකෙනුයේ කවර කාල පරිච්ඡේදයක්ද ?

b. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් මැටි ඔරු සුසාන භූමි පිහිටි ස්ථාන තුන ලියන්න. (ලකුණු 05)

iv. මුල් ඓතිහාසික යුගයේ දී ජනාවාස ව්‍යාප්ති රටාවේ දක්නට ලැබෙන ලක්ෂණ තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

5. i. අතීත ශ්‍රී ලංකාවේ පහත දැක්වෙන පුද්ගලයන් හැඳින්වූ තනතුරු නාම අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A. පවුලක ප්‍රධානියා

B. ගමක ප්‍රධානියා

C. වැව් පද්ධතියක් සහිත ප්‍රදේශයක් පාලනය කළ පුද්ගලයා

(ලකුණු 03)

ii. මධ්‍ය පාලනයට සම්බන්ධ පහත සඳහන් කාර්යයන්හි නිරත වූ පුද්ගලයන්ගේ නිළනාම මොනවාදැයි වරහන් තුළින් තෝරා A, B, C හා D අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A. අශ්ව අංශයේ ප්‍රධානියා. B. භෝජන ශාලා අධිකාරි.

C. චත් සිරිත් සහ චාරිත්‍ර පිළිබඳ අධිකාරි. D. නගර පරිපාලක. (ලකුණු 04)

(බතගු, කොතුරුගැනා, නගර වුධික, අස අදෙක, නගර ගුතික, පන අදෙක, රූප අදෙක, කනපෙඩික)

iii. රජතුමාගෙන් ඉටුවිය යුතු යුතුකම් දෙකක් නිදසුන් මගින් විස්තර කරන්න. (ලකුණු 05)

iv. දුටුගැමුණු රාජ්‍ය සමයේ වැදගත්කම පහත දක්වා ඇති කරුණු ඔස්සේ පැහැදිලි කරන්න.

a. දේශපාලන

b. ආර්ථික (ලකුණු 06)

6. i. අතීතයේදී විදේශ වෙළඳාමට සම්බන්ධ වූ ශ්‍රී ලංකාවේ පැරණි වරායන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. පුරාණ ශ්‍රී ලංකාවේ පැවැති වෘත්තීන් හතරක් ලියන්න. (ලකුණු 04)

iii. බදුලු ටැම් ලිපියේ සඳහන් වෙළඳ නීති තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv. මෙරට පාලනය කළ බුද්ධිමත් රජවරු අසල්වැසි රාජ්‍යයන් සමඟ ඉතා සුහදශීලි සබඳතා දැක්වූ බව කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

7. i . පහත A, B, හා C කරුණු වලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

A. ජලයේ නියමිත ප්‍රමිතිය සහ සිසිලනය ආරක්ෂා කිරීමට සෑදූ ළිං

B. උස් ගොඩනැගිලි අකුණුවලින් ආරක්ෂා කරන ලද උපාංගය

C. ජලය පාලනය කිරීමට සොරොව්වකට සම්බන්ධ කර තිබූ ගල් කුළුණු

(ලකුණු 03)

ii. මෙරට විසූ අතීත පාලකයින් මහ වැව් තැනවීමේ අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. a. වැවක ප්‍රධාන අංග තුනක් නම් කරන්න.

b. ඉන් එක් අංගයක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. පුරාණ යකඩ නිස්සාරණය පිළිබඳ සාක්ෂි හමුවන ස්ථාන දෙක දක්වා ඒවායේ යකඩ නිස්සාරණය කළ ආකාරය විස්තර කරන්න. (ලකුණු 06)

8. i. ඓතිහාසික යුගයේ සමාජයේ ප්‍රභූන් ලෙස සැලකූ කණ්ඩායම් තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. සමාජ සංවිධානයක දක්නට ලැබෙන ධූරාවලි දෙක සඳහන් කරන්න. (ලකුණු 04)

iii. a. බදු නීතිය යටතේ අයකළ ප්‍රධාන බදු වර්ග තුනක් දක්වන්න.

b. සතුන් ආරක්ෂා කර ගැනීමට අමණ්ඩ ගාමිණී අභය රජතුමා පැනවූ නීතිය කුමක්ද? (ලකුණු 05)

iv. පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා රජවරුන් ගත් ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න (ලකුණු 06)

9. i. පහත A B C ප්‍රකාශ වලට අදාළ පිළිතුර පිළිවෙළින් ලියා දක්වන්න.

A. ධාන්‍ය වර්ග බැද කුඩු කොට සාදාගත් ආහාරය

B. කටුක භාණ්ඩ ලෙස හැඳින්වූයේ

C. තිල සංගුලිකා ලෙස හැඳින් වූ අතුරුපස ආහාරය (ලකුණු 03)

ii. අතීත ජනතාව එළවළු පිසීම සිදුකළ ආකාර හතරක් ලියන්න. (ලකුණු 04)

iii. ලාංකික කාන්තාව අතීතයේ දී පාලනයට සම්බන්ධ වූ බව නිදසුන් දෙකකින් විස්තර කරන්න. (ලකුණු 04)

iv. පැරණි කාලයේ විසූ කාන්තාවන් රූපලාවන්‍ය කටයුතු සඳහා උනන්දු වූ බව නිදසුන් තුනකින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

දෙවන වාර පරීක්ෂණය 2025

පිළිතුරු පත්‍රය 10 ශ්‍රේණිය ඉතිහාසය

I කොටස

| | | | |
|---|---|---|---|
| (1). 2 | (11). 1 | (21). 1 | (31). 1 |
| (2). 2 | (12). 4 | (22). 2 | (32). 2 |
| (3). 4 | (13). 1 | (23). 2 | (33). 4 |
| (4). 4 | (14). 2 | (24). 4 | (34). 3 |
| (5). 2 | (15). 1 | (25). 1 | (35). 4 |
| (6). 1 | (16). 3 | (26). 3 | (36). 3 |
| (7). 4 | (17). 3 | (27). 4 | (37). 1 |
| (8). 2 | (18). 3 | (28). 4 | (38). 2 |
| (9). 1 | (19). 2 | (29). 2 | (39). 4 |
| (10).2 | (20). 3 | (30). 3 | (40). 3 |

II කොටස

1. (ආ) i. A. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා

B. වසභ රජතුමා

C. සකපෝරුව

D. රළපනාව

ii. A රූපය

1. පබළු මාලය
2. ඉබ්බන්කටුව
3. පූර්ව ඓතිහාසික යුගය (ක්‍රිස්තු පූර්ව 700 – 450)
4. ප්‍රභූන්

iii. 1. සීගිරි අප්සරාවන් / සීගිරි ලලනාවන්

2. සීගිරිය

3. සීගිරි කාශ්‍යප / පළමුවන කාශ්‍යප

4. විජ්ජුලතාවන් සහ මේඝ ලතාවන්

2. i. *මූලාශ්‍රය රචනා වූ කාලය

*මූලාශ්‍රයේ කතුවරයා

* කතුවරයාගේ අරමුණු

* මූලාශ්‍රයට කරුණු සපයා ගත් ආකාරය

ii. A. පැරකුම්බා සිරිත

B. එදා හෙළදිව

C. තඹ මස්ස

D. ඉසුරුමුණි විහාරය

iii. a. * ශීඝ්‍ර නාගරීකරණය

* ජනාවාස ව්‍යාප්තිය

* මංමාවත් තැනවීම

*ගොඩනැගිලි ඉදිකිරීම

*කෘෂිකාර්මික කටයුතු

* නිදන් හෑරීම

* ඓතිහාසික ස්ථානවල හෝ පුරාවස්තු මත අකුරු ලිවීම හෝ රූප ඇඳීම

b. *නීති පැනවීම

* දඬුවම් කිරීම

* ජනතාව දැනුවත් කිරීම ආදී ලෙස සුදුසු පිළිතුරු වලට ලකුණු ලබා දෙන්න

iv. * තමා ජීවත් වන සමාජය හා ලෝකය පිළිබඳ යථාවබෝධය

* අතීත අත්දැකීම් මගින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩනැගීම

* ජාතික අනන්‍යතාවය හඳුනා ගැනීම

* ජාතික සමගිය

*අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම

*විවිධ මත ඉවසීමට හුරුවීම

3. i. *තෙත් කලාපය

* ශුෂ්ක කලාපය

*අර්ධ ශුෂ්ක කලාපය

* පහතරට වියලි කලාපය

* පහතරට අතරමැදි වියලි කලාපය

*කඳුකර වියළි අතරමැදි කලාපය

ii. *ආහාර සඳහා අවශ්‍ය කරන ස්වාභාවික සම්පත් බහුලව ඇද්ද යන්න පිළිබඳව

* ජලය පහසුවෙන් ලබාගත හැකිද යන්න පිළිබඳව

* ගල් මෙවලම් තනා ගැනීමට අවශ්‍ය කරන පාෂාණ වර්ග බහුලව ඇද්ද යන්න පිළිබඳව

iii. a. වල් දෙල්, කැලෑ කෙසෙල්, කැලෑ දෙල්, කටු අල, කිතුල් ඇට, දෝතලු ඇටවල මදය

b. ගවරා, කුළු මීහරකා, කළු වලහා, වල් ඌරා, ගෝනා, තිත් මුවා, මී මින්නා, ඉත්තෑවා, හාවා, දඬුලේනා, හම්බාවා, මුගටියා, උරුලෑවා, වඳුරා, වලි කුකුලා, හබන් කුකුලා, තලගොයා, තිත්තයා, බෙල්ලන්

iv. *පිළිස්සූ මැටි වළන් භාවිතය ආරම්භ කිරීම

*ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි අනුගමනය කිරීම

*යකඩ ලෝහ භාවිතය

*ස්ථිර ජනාවාස ඉදිකිරීම

*කෘෂිකර්මාන්තය ඇරඹීම

4. i. *වාර්ෂික වර්ෂාපතන අගය

* පසේ ස්වභාවය

*භූ විෂමතාවය

*ස්වාභාවික සම්පත්ව වල ව්‍යාප්තිය

*ජල වහනය

ii. *සුමන වාපිගාම

*විහාර වාපිගාම

* හුන්දරි වාපිගාම

* කඩහ වාපිගාම

iii. a. * ප්‍රාග් ඓතිහාසික යුගයේ අවසානයත් ඓතිහාසික යුගයේ ආරම්භයත් අතර කාල පරිච්ඡේදය (ක්‍රිස්තු පූර්ව 2400 – ක්‍රිස්තු පූර්ව 450 දක්වා)

b. රංවාමඩම, බෙරගල, හල්දූම්මුල්ල

iv. *කුඩා වැව් කේන්ද්‍ර කොටගෙන ජනාවාස ව්‍යාප්තවීම

*ගංගා නිම්නවලට පිටතින් පිහිටි ප්‍රදේශවල ව්‍යාප්තවීම

*ජනාවාස ව්‍යාප්තිය භෞතික සාධක මත තීරණය වීම

*වෘත්තීන් මත පදනම් වූ ජනාවාස ව්‍යාප්තව වීම

* පරික්ඛිත ගම් හා අපරික්ඛිත ගම්

*පුර හා නගර ජනාවාස

*කාර්ය මත පදනම් වූ ගම්

5. i. A. ගෘහපති / ගහපති

B. ගමික /ග්‍රාමික/ ග්‍රාමභෝජක/ ගාමිණි/ ගමනි

C. පරුමක

ii. A. අස අදෙක

B. බතගු

C. කොතුරුගෑනා

D. නගර ගුතික

iii. * රටේ වැව් අමුණු තනවා ආර්ථික තත්ත්වය නගා සිටුවීම

*ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා වෙහෙර විහාර ඉදිකිරීම

* ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීම

*රටේ සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම (ආක්‍රමණවලින් රටේ ජනතාව ආරක්ෂා කිරීම)

iv. a. *ශ්‍රී ලංකාව ප්‍රථම වරට එක්සේසත් කිරීම

b. *රුවන්වැලි සෑය ඉදිකිරීම

* ලෝවාමහාපාය ඉදිකිරීම

* මිරිසවැටිය ඉදිකිරීම

6. i. * මහා තිත්ත

* ගෝකන්න තිත්ත

* දඹකොළ පටුන / ජම්බුකෝල පට්ටන

* ගොඩවාය / ගෝඨපබ්බත

ii. * ගුරු වෘත්තිය

* වෛද්‍ය වෘත්තිය

*නීති විශාරදයෝ/ නීතිඥ වෘත්තිය

* විවිධ ශිල්පීන්( නැට්ටුවන්, චිත්‍ර අඳින්නන්, කවියන්)

iii. * වෙළඳපොළට පැමිණෙන කරත්තවලින් මිස වෙළඳපළ පසුකොටගෙන යන කරත්තවලින් බදු අය කර ගැනීම නොකළ යුතු බව

* හිරු එළියෙන් ආවරණය වන පරිදි මඩුවක පමණක්ම බුලත් වෙළඳාම් කල යුතු බව

* පොහෝ දිනවල වෙළඳාම සිදුකළ අයගෙන් දඩ මුදල් අයකර මහියංගන විහාරයට පහන් දැල්වීමට තෙල් ලබාදිය යුතු බව

iv. *රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා මත පළමුවන ගජබාහු රජතුමා පත්තිනි දේවාලයක් විවෘත කිරීමට ඉන්දියාවේ චේර රාජ්‍යයට පැමිණීම

* භාතිකාභය රජතුමා රුවන්වැලි සෑය අලංකාර කිරීමට වීදුරු පබළු ගෙන ඒම සඳහා රෝමයට තානාපතිවරු යැවීම

* හයවන අග්ග බෝධි රජු සමයේ විසි වතාවක් ලංකාවෙන් චීනයට වෙළෙඳ හා සංස්කෘතික සබඳතා සඳහා දූතයන් යැවීම

* පළමු වන විජයබාහු රජතුමා කාලිංග දේශයෙන් තිලෝකසුන්දරී විවාහ කර ගැනීම සහ නැගණිය මිත්තා කුමරිය පාණ්ඩ කුමාරයෙකුට විවාහ කරදීම

* පළමු වන විජයබාහු රජතුමා දළදා මාලිගාවේ ආරක්ෂාවට වේළක්කාර හමුදාව පත්කිරීම

* අල් බලසූරි සඳහන් කරන අන්දමට රතු කැට දිවයිනේ රජු සහ ඉස්ලාමීය රජු තෑගි හුවමාරු කර ගැනීම

7\. i. A. ඌරා කැට ලිං

B. වජ්‍රවුම්භට

C. දිය කැට පහන

ii. * කෘෂිකාර්මික කටයුතු සාර්ථක කරගැනීම

* ගංවතුර පාලනය කිරීම

* නාගරික ජනතාවගේ වෙනත් අවශ්‍යතා සම්පූර්ණ කිරීම

iii. a. වැව් බැම්ම සොරොව්ව බිසෝ කොටුව පිටවාන රළපනාව

b. <u>වැව් බැම්ම</u>

* පිහිටි ගලක් ඇති ස්ථානයක වැව් බැම්ම ඉදිකිරීම

* කඳු ගැට දෙකක් යාකොට නිමවා තිබීම

* කඳු ගැට නොමැති විට චාපාකාර ලෙස ඉදිකිරීම

*ජලය රඳවා ගැනීම ප්‍රධාන කාර්යවීම

<u>සොරොව්ව</u>

* විශාල ගල් පතුරු යොදා ගනිමින් නිශ්චිත උසකින් විවරයක් ලෙස නිර්මාණය කිරීම

* ගොඩ හා මඩ සොරවූ තිබීම

* ගොඩ සොරොව්වෙන් ප්‍රධාන ඇළට ජලය නිකුත් කිරීම

* මඩ සොරොව්වෙන් රොන්මඩ ඉවත් කිරීම

<u>බිසෝ කොටුව</u>

* ගල් පතුරු යොදා ගනිමින් ආයතන චතුරස්‍රාකාර අවකාශයක් ලෙස නිර්මාණය කිරීම

* ජලය ඇළට නිකුත් කිරීමේ දී වැව් බැම්මට ඇතිවන පීඩනය අවම කරමින් ජලය මුදා හැරීම මෙහි කාර්ය වේ

<u>පිටවාන</u>

* ගල් කුට්ටි සියුම් ලෙස එකිනෙකට තදවන සකස් කරමින් වැවක කෙළවර වැව් බැම්මට පහළින් ඉදිකිරීම

* වැවේ ඇති වැඩි ජලය ඉවත් කිරීම මෙහි කාර්යයි

<u>රළ පනාව</u>

* තරංග වලින් ඇතිවන බලය නිසා වැව් බැම්ම ඛාදනය වීමේ අනතුර වළක්වාලීමට ඉදිකර ඇත

*වැව් බැම්මේ ඇතුළු පැත්තේ ගල් ඇතිරීමෙන් රළ පනාව තනා ඇත

iv. * බළන්ගොඩ සමනල වැව ප්‍රදේශය ස්වාභාවික සුළං බලයෙන්

* සීගිරියේ අල කොළ වැව දෙහිගහ ඇලකන්ද ප්‍රදේශය මයිනහමක ආධාරයෙන්

8. i. * වෙළෙඳ ප්‍රධානීන්

* නාවික කටයුතුවල යෙදුණු කප්පිත්තන්

*ගුරුවරු

*වෛද්‍යවරු

ii. * තිරස් දූරාවලිය

* සිරස් දූරාවලිය

iii. a. *දකපති

*බොජකපති

* මතරමපිබක

b. * මාඝාත නීතිය ( කිසිදු සතෙකු නොමැරිය යුතුයි )

iv. *උස් ගොඩ බිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතු බවට නියෝග කිරීම

* කැලෑවල ගස් කොලන් නොකැපිය යුතු බව

* ගස් කොලන් කළමනාකරණයේදී රජය විසින් පනවා තිබෙන නීති රීතිවලට අනුකූලව ක්‍රියාකරන ලෙස රජයේ නිලධාරීන්ට උපදෙස් දී තිබීම

*ස්වාභාවික පරිසරයේ ජීවත්වන සතුන් ආරක්ෂා කිරීමට නීති පැනවීම

9. i. A. අත්සුණු

B. කුළුබඩු වර්ග ( තුනපහ )

C. තලගුලි

ii. * බැදුම්

* මැල්ලුම්

* හොද්ද

*ඇඹුල

* නියඹලාව

iii. * චූල සීවලී දේවී නම් රැජිණ පිළිබඳව සඳහන් වන සෙල්ලිපියක් ළාහුගල පිහිටි නිල්ගිරි සෑය නමින් හැඳින්වෙන පැරණි ස්ථූපය අසලින් සොයා ගැනීම

* ලීලාවතී රැජිණ තෙවරක් මෙරට පාලනය කිරීම

* අනුරාධපුරයේ බ්‍රාහ්මණයා ගම නම් ස්ථානයෙන් සොයාගෙන තිබෙන සෙල්ලිපියක පරමකලු සමනා නම් කාන්තාවක් ගැන සඳහන් වීම ඇය පරුමක නදිකගේ බිරිඳ ලෙස සඳහන් වේ


iv. * ඇස් පිහාටු වර්ණ ගැන්වීම සඳහා භාවිත කළ ලෝහකූරක් රත්නපුරේ උඩරංවා මඩම නිවාසයෙන් හමුවීම

* සම වර්ණවත් කිරීමට ගත් රතු සහ කහ පැහැති ගුරුගල් කැබලි හමුවීම

* මැටි පබලු හමුවීම

* ගෙල පළඳින මාලයක් ඉබ්බන්කටුවෙන් හමුවීම

01. i.



ii.

